නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**12 ශ්‍රේණිය**

## සිංහල විෂයය

## සිංහල අක්ෂර වින්‍යාසය (02 ඒකකය)

**විෂය භාර ආචාරිනී - වාසනා පයාගල**

නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,
Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

1. පහත දැක්වෙන පාඨ සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුත් පදය වරහන් තුළින් තෝරා ලියන්න.

    1. ප්‍රථම පුරුෂ (දෘෂ්ඨිකෝණය, දෘශ්ඨිකෝණය, දෘෂ්ටිකෝණය)
    2. ඉන්දු නිම්න (ශිෂ්ටාචාරය, ශිෂ්ඨාචාරය, ශිශ්ටාචාරය)
    3. නාම (ලේඛණය, ලේඛනය, ලේකණය)
    4. ධර්ම (පුස්ථකය, පුස්තකය, පුශ්ථකය)
    5. (ගවේශන, ගවේෂණ, ගවේෂන) කටයුතු
    6. ජනගහන (වර්ධණය, වර්ධනය, වර්දනය)
    7. විශිෂ්ට (සාමර්ථ්‍යය, සාමාර්ථය, සාමාර්ථ්‍යය)
    8. (ශීග්‍රගාමි, ශීඝ්‍රගාමි, සීඝ්‍රගාමි) දුම්රිය
    9. වැහි (වලාකුළ, වළාකුල, වළාකුළ)
    10. (නිෂ්ඵල, නිෂ්පල, නිශ්ඵල) ව්‍යායාමයක් (..........)

2. පහත දැක්වෙන වාක්‍යවල එක් පදයක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම පදය පමණක් නිදොස් කර ලියන්න.

    1. පොලිස් නිලධාරියා නිවසේ සියළු ස්ථාන මැනවින් පරීක්‍ෂා කළේ ය.
    2. අද්‍යතන සමාජයේ බෙහෝ දෙනෙකු සම්ප්‍රධාය නොබිඳ ඉදිරියට යාමට අසමත් වී ඇත.
    3. අසරණ සතුන් මරණ මිනිසුන් සිතා සිටින්නේ තමා නොමැරෙන බව ද?
    4. ඉපැරණි යුගවල දී ද ශිෂ්ඨ සමාජ පැවති බව නෂ්ටාවශේෂ හා අනෙකුත් මූලාශ්‍රවලින් අනාවරණය වේ.
    5. මහළු නිවාසයේ වාර්ෂික දානමය පිංකම ඊයේ පැවැත්විණි.
    6. ධර්ම දේශණය පවත්වන ලද්දේ ප්‍රවීණ ධර්ම දේශකයාණන් කෙනෙකු විසිනි.
    7. වළාකුළු අහසේ පාවෙන විට මොනරු ප්‍රීති වෙති.
    8. සඳකඩපහන හෙළ කලාකරුවාගේ නිර්මාණ කෞශල්‍යයට මනා නිදසුනකි. (..........)

3. I. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. ප්‍රතිමා, ස්ථූප, ප්‍රතිඵල, ඥානය
2. ප්‍රශස්ත, විශ්වාසය, ආස්වාදය, ප්‍රශ්වාස
3. අවගුණ, මොණරා, විරෝධාර, ගවේෂණය
4. ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ, ධර්මිෂ්ඨ, ශ්‍රේෂ්ඨ
5. අගල, වළාකුළ, හදාළ, සපල (..........)

II. 1. අඹුව, පිළිවදන, අජඨාකාශ, නිර්භය
2. ප්‍රශස්ත, දලදාව, නිගණ්ඨ, විශේෂ
3. පුස්ථකය, ළදළු, නිස්සාර, ප්‍රදර්ශනය
4. ගර්භය, විශ්වාස, ප්‍රහීන, ලේඛන
5. දේශණය, දෘෂ්ටිය, පඨවි, ධාතුව (..........)

III. 1. ගෘහස්ත, ඉච්ඡාව, ආශ්වාදය, විද්‍යුතය
2. ප්‍රාතිහාර්ය, සම්ප්‍රදාය, විභේදනය, පරාර්ථ
3. කළය, පාපිෂ්ට, පිළිබිඹු, සංක්‍රමණ
4. අර්බුදය, මර්දනය, වර්ධනය, නිශ්ක්‍රීය
5. ශ්‍රවණය, මරණය, නර්තනය, වර්ශනය (..........)

IV. 1. මැතිණී, දියණී, මෑණී, නැගණී
2. භාණ්ඩාගාරික, මිණී කිරණ, ධරනිතලය, ප්‍රණාමය
3. බළ සෙනඟ, නාදලු, එළවළු, මිහිලිය
4. හෘදයාංගම, අත්‍යාවශ්‍ය, අභ්‍යාවකාශ, සාරාංශ
5. ජ්‍යෙෂ්ඨ, ශ්‍රේෂ්ඨ, ධර්මිෂ්ඨ, උත්කෘෂ්ඨ (..........)

V. 1. නිදර්ශන, විමර්ශන, ප්‍රශ්ණ, උෂ්ණ

2. ප්‍රභේද, සෞඛ්‍යය, සාමාර්ථය, ශීඝ්‍රගාමී

3. වීර්යය, සූර්යයා, කාර්යාලය, කායීය

4. දෘෂ්ඨිය, පෘෂ්ඨය, පාඨශාලාව, පාඨය

5. සේවාස්ථ, දුර්භික්ෂ, අධ්‍යක්ෂ, බාහුශ්‍රැත (..........)

4. පහත දැක්වෙන ඡේදයේ වැරදි අක්ෂර වින්‍යාසය සහිත පද නිවැරදි කර ලියන්න.

පුරාතන සාහිත්‍ය නිර්මානවලට වැඩි වසයෙන් ම පදනම් ව ඇත්තේ කතාන්දර ය. ඇතැම් ග්‍රන්තයන්හි ලක්දිව පසුබිම් කර ගත් ඓතිහාසික මෙන් ම ආගමික කතාන්දර ද ඇතුලත් වෙයි. ඇතැම් කතා රසවත් කෙටිකතා වසයෙන් දියුනු කල හැකි වස්තු බීජවලින් සමන්විත ය. පැරනි භාරතීය සාහිත්‍යයේ ද ලාංකීය සාහිත්‍යයේ ද උසස් කතාන්දර අගය කරන මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස වූයේ සිංහල කෙටිකතාවට බටහිර කෙටිකතාවේ ආභාෂය නොලැබුණු බව ය.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

5. සුදුසු මහප්‍රාණ පද යොදා මෙම වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. දීර්.......... ගමනකින් පසු අපි අපේක්ෂිත ස්..........නය කරා ළඟා වීමු.

2. ම..........යාහ්නයටත් පෙර ම මේ..........වලාවෝ අහස්කුස වසා ගත්හ.

3. සෙත් පිරිත් සජ්..........යනය මැද අමාත්‍යවරයා අ.........නව ධුරයේ වැඩ භාර ගත්තේ ය.

4. බලාපොරොත්තු වූ ප්‍රති..........ල නො ලැබීමෙන් ඔහු ඉච්.......... භංගත්වයට පත් විය.

5. උට්..........න වීර්යයෙන් කටයුතු කර ලේ.........කයකු ලෙස නමක් දිනා ගන්නට මට හැකි විය.